ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | HRC/958/12 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022-09-08 |

පැමිණිලි පාර්ශවය : ඒ.කේ.එම් අන්වර්දීන් මයා,
අංක -24/1, කම්මල් තොටුපොල පාර,
පෝරුතොට,
කොච්චිකඩේ.

වගඋත්තර පාර්ශවය : 01. පු.පො.ප - සී.එල් වික්‍රමසිංහ මයා,
ස්ථාන භාර නිලධාරී,
පොලිස් ස්ථානය,
බණ්ඩාරගම.

02. සහකාර පොලිස් අධිකාරී - අබේරත්න දිසානායක මයා,
සහකාර පොලිස් අධිකාරී කාර්යාලය,
පානදුර.

03. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - එම්.ඒ.එඩ්මන්ඩ් මහේන්ද්‍ර මයා,
පොලිස් අධිකාරී කාර්යාලය,
කිලිනොච්චිය.

04. නියෝජ්‍ය පොලිස්පති,
දුක්ගැනවිලි අංශය,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

05. අධ්‍යක්ෂ,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
තැ.පෙ 543, 180, ටී.බී ජයා මාවත,
කොළඹ 10.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் — 011-2505451
ෆැක්ස් / தொலைநகல் — 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் — sechrcsl@gmail.com

**පැමිණිලි අංකය : HRC/958/12**

**පැමිණිල්ලෙන් දක්වා ඇති කරුණු :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති උක්ත අංක දරණ පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, තම බිරිඳට සැත්කමක් සිදුකිරීම සඳහා එකතු කරන ලද මුදල් තමාගේ අනුදැනුමකින් තොරව වෙනත් පාර්ශවයක් විසින් ලබා ගැනීම සම්බන්ධයෙන් තමා විසින් පොලිස් ස්ථානය වෙත පැමිණිලි කළද, ඒ පිළිබඳව නිසි ලෙස කටයුතු නොකළ බවයි.

මේ සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් මඟින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින්, පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, තමාගේ බිරිඳගේ දණහිසේ වූ ශල්‍යකර්මයක් පිළිබඳව තම ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථාන පාලක මණ්ඩලයේ ලේකම් වෙතින් ලබාගත් ලිපියක් අනුව මුදල් එකතු කරමින් සිටියදී 2011.01.01 දින තම බිරිඳගේ සැත්කම සඳහා පැමිණිලිකරු බණ්ඩාරගම ප්‍රදේශයේ මුදල් රැස්කරමින් සිටින අතරතුර යතුරුපැදියට ගොඩවන ලෙස නන්නාදුනන පුද්ලයෙකු තමාට බලපෑම් කළ බවත්, ඉන් පසුව පැමිණිලිකරුට නජීම් හජ්ජියාර් නැමැති පුද්ගලයෙකු ළඟට ගෙන ගිය බවත්, එදින එකතු කරගත් මුදල් කලීල් මාස්ටර්ගෙන් ලැබුනු අවසර ලිපිය ලබාගත් බවත් සඳහන් කර ඇත.

මෙම සොරකම පිළිබඳව පැමිණිලි කිරීමට පැමිණිලිකරු තම බිරිඳ සමඟ 2011.01.04 වන දින බණ්ඩාරගම පොලිස් ස්ථානයට ගිය විට එහි ස්ථාන භාර නිලධාරියා තම පැමිණිල්ල සටහන් කර ගැනීම ප්‍රතික්ෂේප කර ඒ සඳහා බලපෑම් කිරීම යන හේතුව මත සිරකුටියක විනාඩි 15 ක කාලයක් ඔහුව රඳවා ගත් බවත්, සඳහන් කර ඇත.

**1 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

1 වන වගඋත්තරකරු විසින් 2012.03.22 කොමිෂන් සභාව වෙත වාර්තාවක් ලබා දී ඇති අතර, එහිදී පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලද බව දක්වා ඇති නමුත් විමර්ශනයක් කළ බවට කරුණු දැක්වීමක් නොමැත.

**3 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

පානදුර කොට්ඨාශයේ ස්ථානභාර නිලධාරී ලෙස 2011.01.01 සිට 2011.06.23 කාලය දක්වා කටයුතු කළ 3 වන වගඋත්තරකරුගෙන් වාර්තාවක් (2014.09.22 දිනැති) කොමිෂන් සභාවට කැඳවා ඇත. පැමිණිලිකරු විසින් පොලිස් සහන මැදිරියට ගොස් කළ වෙනම පැමිණිල්ලකට අනුව 3 වන

වගඋත්තරකරුගෙන් පසුව රාජකාරී භාරගත් නිලධාරියා විසින් සිදුකළ පරීක්ෂණයකින් හෙළිදරව් වූ කරුණු එම වාර්තාවෙහි සඳහන්ය.

1 වන වගඋත්තරකරු පොලිස් ස්ථානයේදී පැමිණිලිකරුගේ විස්තර භාරගැනීමට ප්‍රතික්ෂේප කිරීම මෙන්ම පැමිණිලිකරුව එම ස්ථානයේ සිර කූටියක රඳවා තබාගැනීම එම වාර්තාවෙන් තහවුරු වේ. එකී වාර්තාවට අනුව පැමිණිලිකරු 2011.01.01 දින නජීබ් හාජ්යාර් විසින් සිදුකළ සොරකමක් පිළිබඳව පැමිණිලි කිරීමට තම පොලිස් ස්ථානයට පැමිණි බව 1 වන වගඋත්තරකරු දක්වා ඇත.

**කොමිෂන් සභාව මඟින් කළ විමර්ශනය :-**

පැමිණිලිකරු තම පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දැමූ බවත්, එය තමා විසින් විමර්ශනය කළ බවත්, 1 වන වගඋත්තරකරු පුද්ගලිකව පෙනී සිටිමින් විමර්ශනයේදී සිදුකළ බවත්, පැමිණිලිකරු නජීම් හාජියාර් යන දෙදෙනා එකී විමර්ශනයට සම්බන්ධ වී එහිදී පාර්ශව දෙක අතර සමථයක් ඇති වී ඇත.

කෙසේ වුවද ලත් පැමිණිල්ල හෝ ඊට අදාළව ගත් සමථ ක්‍රියාමාර්ග පිළිබඳ සාක්ෂි කිසිවක් ඉදිරිපත් කිරීමට 1 වන වගඋත්තරකරු අපොහොසත් වී ඇත.

2 වන වගඋත්තරකරු දක්වා ඇත්තේ, පැමිණිලිකරු හා නජීම් හාජියාර් සමාදාන කිරීම මඟින් මිත්‍ර කරලීමට තමා උත්සහ කළ බවත්, මෙහිදී නජීම් හාජ්යාර් පැමිණිලිකරුගෙන් සොරාගත් බවට චෝදනා එල්ල කළ මුදල වෙනුවට මුදල් ප්‍රමාණයක් ලබාදීමට එකඟ වූ බවත්, සමථයකට පත් කිරීමට ගත් උත්සහයන් පැමිණිලිකරු ප්‍රතික්ෂේප කරමින් නීති පියවර ගන්නා ලෙස පැවසූ බවත්, දක්වා ඇත.

පොලිස් සහන මැදිරිය මඟින් පැමිණිලිකරුගේ දුක්ගැනවිලි දැනුම් දෙන විට 03 වන වගඋත්තරකරු අදාළ කාර්යාලයේ රැඳී සිටියා වුවද විමර්ශනය අවසන් වීමට පෙර ඔහුව කිලිනොච්චියට මාරු කළ බවත්, කොමිෂන් සභාව ඉදිරියේ විභාග වෙමින් තිබූ විමර්ශනයේදී 3 වන වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටින ඔහුගේ නියෝජිතයා සඳහන් කර ඇත. ඒ අනුව විමර්ශනය ඔහුගේ අනුප්‍රාප්තික නිලධාරියා (පානදුර කොට්ඨාශයේ පොලිස් අධිකාරී එච්.එම් ධර්මසේන) විසින් සිදුකර ඇත.

**නිරීක්ෂණ හා නිගමන :-**

වරදක් සිදුකිරීම සම්බන්ධිත සෑම තොරතුරක්ම පොලිස් නිලධාරීන් ලබා දිය හැකි යැයි අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109(1) හි සඳහන් වේ. එවැනි තොරතුරු සියල්ල කිසිදු ප්‍රමාදයකින් තොරව අදාළ පොලිස් නිලධාරියා විසින් පොලිස් ස්ථානය භාර නිලධාරියා සන්තකයේ ඇති තොරතුරු පොතේ සටහන් කළ යුතු බව 109(3) හි සඳහන් වේ. මෙම ප්‍රතිපාදන මඟින් වරදකට ලත් තොරතුරු අදාළ

පොලිස් ස්ථානයේ තොරතුරු පොතේ සටහන් කිරීමට පොලිස් නිලධාරීන්ට පැවරෙන පරම රාජකාරිය පැහැදිලිව සඳහන් කර ඇත. 109(5) (ආ) වගන්තියේ දැක්වෙන අන්දමට විමර්ශනයක් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් මූලික තත්වයන් කිසිවක් නොමැති බවට පොලිස් ස්ථානයක් භාරව සිටින නිලධාරියාට ඒත්තු යන්නේ නම් එය විමර්ශනයට ලක්කිරීමට ඔහුට බැඳීමක් නොමැති යැයි සඳහන් වේ. ඒ අනුව වරදක තොරතුරු සටහන් තබාගැනීම අනිවාර්ය වුවද එම තොරතුරු මත පදනම්ව විමර්ශනයක් දියත් කිරීම අනිවාර්ය නොවේ. ඒ අතර ලත් තොරතුරු සහටන් කිරීමේ රාජකාරිය සියළු පොලිස් නිලධාරීන්ට පැවරුන ද ඉදිරි කටයුතු කරගෙන යාම හෝ එවැනි තොරතුරු බැහැර කරලීමේ අභිමතය අදාළ පොලිස් ස්ථානයේ ප්‍රධානියා මත රැඳේ.

මෙහි පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් චෝදනා කරන්නේ තමා 1 වන වගඋත්තරකරුගේ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කිරීමට පැමිණියද එය සටහන් කර නොගත් බවයි. 1 වන හා 2 වන වගඋත්තරකරුවන් මෙම චෝදනාව ප්‍රතික්ෂේප කළද 109(3) වගන්තිය යටතේ බැඳීම් උල්ලංඝනය කිරීමක් ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අතරම ප්‍රශ්නගත පැමිණිල්ල තම පොලිස් ස්ථානයට නොලැබුනු බව කොමිෂන් සභාව වෙත ලිඛිතව දන්වා සිටින 1 වන වගඋත්තරකරු කොමිෂන් සභාව ඉදිරියේ පුද්ගලිකව මෙම කරුණු පරස්පර විරෝධීව දක්වා ඇත. එනම් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලද බව 2015.07.21 විමර්ශනයේදී පිළිගෙන ඇත. එම කරුණු 2 වන හා 3 වන වඋත්තරකරුවන් විසින් ද ප්‍රතික්ෂේප කර ඇත.

පැමිණිලිකරු හා නජීම් හජියාර් අතර වූ ආරවුල පැමිණිලිකරු පොලිස් ස්ථානයට පැමිණි දිනම සාර්ථකව බේරුම් කළ බව 1 වන වඋත්තරකරු දන්වා ඇත. එසේ වුවද තම පොලිස් ස්ථානයේ කිසිදු පැමිණිල්ලක් නොකළ බවට පැවසීම මගින් මෙම ප්‍රකාශය ඔහුගේ ලිඛිත සටහන් සමඟ පරස්පර විරෝධී වේ. තවද සමථකරණයක් වූ බවට කිසිදු සටහනක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාළව ප්‍රතික්‍රියා දැක්වූ යැයි කියන 1 වන වගඋත්තරකරුගේ ප්‍රකාශ පිළිබඳ ප්‍රශ්න සහගත වේ.

තම පැමිණිල්ල සටහන් කිරීමට බලපෑම් කිරීමක් ලෙස තමාව පොලිස් ස්ථානයේ සිර මැදිරියේ රඳවා සිටි බව පැමිණිලිකරු පවසයි. මෙම ප්‍රකාශය ඔහු විසින් අවස්ථා ගණනාවකදී තරයේ කියා සිටියද කොමිසම ඉදිරියේ පැවැති පරීක්ෂණයේදී 1 වන වගඋත්තරකරු කිසිදු අවස්ථාවකදී මෙය ලිඛිතව හෝ වාචිකව ප්‍රතික්ෂේප කර හෝ සාධාරණීකරණය කර නොමැතිවීම තුළ නීති විරෝධී අත්අඩංගුවේ තබා ගැනීමේ චෝදනාව සත්‍ය වන බව වඩාත් තහවුරු වේ.

කොමිසම හමුවේ ඔහුගේ ප්‍රකාශය හා වාර්තා මගින් පැහැදිලිව නිරීක්ෂණය කරනුයේ 1 වන වගඋත්තරකරු තම රාජකාරී සිදුකිරිමෙන් වැළකී ඇති බව 2 වන වගඋත්තරකරුට නිරීක්ෂණය වී ඇති

බවයි. පැමිණිලිකරුගේ සිද්ධිය පොලිස් සහන මැදිරිය හරහා දැනුම් දුන් විට පැමිණිලිකරු හා නජීම් හාජියාර් අතර වූ ආරවුල බේරුම් කිරීමට 2 වන වගඋත්තරකරු පියවර ගත්තා වුවද මේ සඳහා කිසිදු පියවරක් නොගෙන තමා යටතේ සේවයේ නියුතු එනම් 1 වන වගඋත්තරකරු සිදුකළ වැරදි ක්‍රියාවට එරෙහි පියවර නොගෙන ඇති බව කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ.

එමෙන්ම තුන් වන වගඋත්තරකරුගේ අනුප්‍රාප්තිකයා වන එච්.එම් ධර්මසේන තම විමර්ශන වාර්තා (2011.07.12 දාතමැති හා උක්ත 5 වන ඡේදයේ සඳහන්) මඟින් තම රාජකාරී ඉටු කිරීමට 1 වන වඋත්තරකරුගේ අපොහොසත් වීම පැහැදිලි වේ. කෙසේ වුවද, විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඔහු නිර්දේශ කර නොමැත. පැමිණිලිකරු නීති විරෝධීව අත්අඩංගුවට ගැනීමේ චෝදනාව පිළිබඳ නිසි ලෙස විමර්ශනය කිරීමට ඔහු අපොහොසත් වී ඇති වුවද මෙම චෝදනාව ඔහුගේ වාර්තාවල හඳුනාගෙන ඇත. විනය ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කර ගැනීමේදී ‘අදාළ වරදකරු හඳුනාගෙන නොමැති නිසා’ යයි පවසා ඇත. කෙසේ වුවද තම රාජකාරිය පැහැර හැරිමට වගකිවයුතු වන්නේ 1 වන වගඋත්තරකරු බව ඔහු තම වාර්තාවෙන්ම හඳුනාගෙන ඇත.

ඒ අනුව 1 වන වගඋත්තර පාර්ශවයට පැමිණිල්ලක් ලද පසු ක්‍රියාත්මක විය යුතු ආකාරයට නිසියාකාරව පැමිණිලිකරුගේ පැමිණිල්ල සම්බන්ධයෙන් කටයුතු කර නොමැති බව කරුණු නිරීක්ෂණය වේ.

ඉහත නිගමනය අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ දක්වා ඇති 12(1) වන ව්‍යවස්ථාව පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් ගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(ඇ) වන වගන්තියට අනුව මෙවැනි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලබන පුද්ගලයන්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට මෙම කරුණු පොලිස්පතිවරයා වෙත යොමු කිරීමට කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කෙරේ.

02. මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(3) (ඇ) වන වගන්තියේ ප්‍රතිපාදන වලට අනුව මෙම සිද්ධිය තුළින් මූලික අයිතිවාසිකම් කඩවීම සිදුවීමට තුඩු දෙන සාවද්‍ය ක්‍රියාකලාපය නිවැරදි කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා වෙත යොමු කිරීමට කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.10.10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
සභාපතිනී,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවශ්‍රී

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/